අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/03/40/04/9 – 2025

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2025.12. 08

සියලුම අතිරේක ලේකම්වරු,
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
විභාග කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන)

**<u>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හා ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන් සඳහා අධ්‍යාපනපති උපාධි (එක් අවුරුදු සති අන්ත) සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම - 2025</u>**

සාමාන්‍ය අධ්‍යාපන හා නවීකරණය කිරීමේ වැඩසටහන (GEMP) යටතේ උක්ත සේවා වල නිලධාරීන් සඳහා අධ්‍යාපනපති උපාධි හැදෑරීම සඳහා පූර්ණ ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතිය ලැබී ඇත.

මේ පිළිබඳ උනන්දුව දක්වන පහත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් ඇමුණුම 01 ආකෘතිය අනුව 2025.12.19 දිනට ප්‍රථම ලැබෙන සේ අධ්‍යාපන අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන ශාඛාව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල ලිපිනයට යොමු කල යුතුය. ලිපි කවරයේ ඉහල වම් කෙළවරේ උක්ත මාතෘකාව පැහැදිලිව සඳහන් කල යුතුය. (අයදුම්පතේ පැහැදිලි scan පිටපතක් <u>Hrd.moefrom2025@gmail.com</u> email ලිපිනය වෙත යොමු කිරීම අවශ්‍ය වේ.)

අයදුම්පත ඉදිරිපත් කිරීමට සපුරාලිය යුතු සුදුසුකම්

1. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරියකු වීම
2. 2025.12.19 දිනට වයස අවුරුදු 55 ට අඩු වීම
3. පශ්චාත් උපාධි සුදුසුකම් සපුරා නොමැති නිලධාරියකු වීම හෝ මෙයට පෙර පශ්චාත් උපාධි, උපාධි පාඨමාලාවන් හැදෑරීම සඳහා පූර්ව ගෙවීමක් හෝ පාඨමාලා ගාස්තු ප්‍රතිපූර්ණයක් ලෙස හෝ රාජ්‍ය මුදල් ලබාගෙන නොමැති නිලධාරියකු වීම. (පශ්චාත් උපාධි සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්ට ජ්‍යෙෂ්ඨතාවය අනුව ප්‍රමුඛතාවය හිමි වේ.
4. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන පාඨමාලාවක් බැවින්, ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීනතාවය සලකා බලනු ලැබේ.

මෙම එක් අවුරුදු සති අන්ත පාඨමාලාව සඳහා තෝරාගනු ලබන නිලධාරීන් පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව නියම කරනු ලබන අනිවාර්ය සේවා කාලයකට යටත් වියයුතු අතර ආරම්භ කිරීමට ප්‍රථම 1998.02.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/98 අනුව ගිවිසුම්ගත විය යුතුය.

මේ පිළිබඳව ඔබ ආයතනයේ/ පළාතේ අදාල නිලධාරීන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර, සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉහත උපදෙස් පරිදි යොමු කරවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ පිළිබඳව ඔබ දක්වන සහයෝගය අගය කොට සලකමි.

සුජාතා තුලේන්ද්‍රකුමාර්
අතිරේක ලේකම් (ප්‍රතිපත්ති, සැලසුම් සහ කාර්ය සාධන සමාලෝචන)
ලේකම් වෙනුවට

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

CamScanner

**…ship Programme of Masters Degree for the officers in the Sri Lanka Education …istrative Service/ Sri Lanka Teacher Educator Service SLEAS/ SLTES) - 2025**

1. Name of the Officer : Rev./ Mr./ Mrs./ Miss. ……………………………………………………

   ……………………………………………………………………………………

2. Current Position : ……………………………………………………………………………
3. Date of appointment to the SLEAS/ SLTES………………………………………………………
4. Service & Grade : ……………………………………………………………………………
5. Date of Admission to the above Grade: ……………………………………………………………
6. Currant Service Station : ………………………………………………………………………
7. Previous post in government service (if any) : …………………………………………………
8. Personal Address : …………………………………………………………………………
9. Subject area related to the post : ……………………………………………………………
10. Date of Birth and Age as on 19.12.2025 : …………………………………………………………
11. Highest Educational Qualifications obtained : ……………………………………………………
12. Professional Qualification obtained : ……………………………………………………………
13. Period of Active Service as on 19.12.2025 : ………………………………………………………
14. WhatsApp Number : ……………………………………………………………………………
15. Email Address : ………………………………………………………………………………
16. Proficiency in English Language : ……………………………………………………………

| | Very Good | Good | Average | Weak | Very Weak |
|---|---|---|---|---|---|
| Reading | | | | | |
| Writing | | | | | |
| Spoken | | | | | |

I certify that the above particulars are true and I declare that I have not received any government funds or as an advance payment as a reimbursement for pursuing a Master's Degree programme.

Date : ……………………………. ……………………..

Signature of the Officer

**Recommendation of the Head of Institute**

I certify that this officer is serving in this institute and there are no any disciplinary inquiries or audit queries against him/ her. Further he/ she has not received any government fund to follow a Master Degree Programme, according to the details of the personal file. If selected for the above mentioned course he/ she can be released (if necessary).

Date : …………………

…………………………………………

Signature & official stamp of the Head of Institute

CamScanner